දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක : 44 / 2014

මගේ අංක:එස්ටීපී/පීඑස්/2014,

බන්ධනාගාර මූලස්ථානය,

කොළඹ - 09,

2014.11.17 වන දින.

සියළුම බන්ධනාගාර අධිකාරීන් සහ සහකාර අධිකාරීන් වෙත,

**2014 වාර්ෂික සංඛ්‍යාලේඛන වාර්තාව සම්බන්ධවයි.**

භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ අංක: එෆ්අයිඑන්/1051/එෆ්/192/18/ජීබී/ඩී හා 1985.06.18 දාතමැති චක්‍රලේඛයෙහි දෙවන (2) ඡේදයට ඔබගේ අවධානය යොමු කරවනු කැමැත්තෙමි.

02. එහි දෙවන ඡේදය අනුව 2014 වර්ෂයේ පාලන වාර්තාව 2015 අප්‍රේල් මස 30 වන දිනට ප්‍රථම මා විසින් අමාත්‍යාංශයට ඉදිරිපත් කලයුතුය.

03. බන්ධනාගාර දෙපාර්තමේන්තුව යටතේ පාලනයවන සෑම ආයතනයකින්ම වාර්තා ලබාගෙන සංඛ්‍යා දත්ත වක්‍ර ගතකර සම්පිණ්ඩනය දෙපාර්තමේන්තුවේ වාර්ෂික සංඛ්‍යාලේඛන වාර්තාව සැකසිය යුතුය.

04. ඔබ ආයතනයේ 2014 වර්ෂයේ සංඛ්‍යාලේඛන වාර්තාව **2015 පෙබරවාරි මස 15 වන දිනට පෙර** මෙම කාර්යාලයට එවීම අනිවාර්යවන අතර, ඉතා පැහැදිලිව හා නිවැරදිව සංසන්දනාත්මක දත්තයන් ඉදිරිපත් කිරීම ඔබගේ වගකීමබව සැලකිය යුතුය.

05. සංඛ්‍යාලේඛන වාර්තාව සැකසීමට අදාල සියළුම ආකෘතිපත් මේ සමඟ එවන අතර, එහි පිටපතක් ඔබ කාර්යාලයෙහිද තබා ගැනීමට වගබලා ගතයුතුය.

06. දත්ත සටහන් කිරීමෙන් පසුව සියල්ල ඉතා නිවැරදි බවට අංශභාර ජේලර්වරයා විසින් වෙන් වෙන්ව පරීක්ෂාකර සෑම පිටුවකම රබර් මුද්‍රාව තබා අත්සන යෙදිය යුතුය.

07. මෙම වාර්ෂික සංඛ්‍යාලේඛන දත්ත සටහන් පොත් ලැබුණු බව දැනුම් දෙන්න.

චන්ද්‍රරත්න පල්ලේගම
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

චන්ද්‍රරත්න පල්ලේගම
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09.